# ඉංගිරිසියට බයේ කෙතට බැස්ස ගැමියා

**නවීන පන්නේ එළවළු නවීන පන්නෙට වගා කරන දිසානායක මහත්තයා හමුවෙලා අපි රාගල පාර දිගේ පල්ලම් බැස්සේ අපේ ගමේ රටේ ගොවි මහත්තයෙක් හම්බ වෙන්න හිතන්. මල් වත්තක ලස්සනට කියා ගෙන තියෙන මල් පාත්ති වැනි තේ වතු මැද්දෙන් පල්ලමට ඇදගෙන කොට නුවරඑළියේ සීතලත් ටිකින් ටික අඩු වුනා. ඌව දිසාවේ තේ වතු ඇතින් පෙනෙද්දී අපේ මහ දෙපස කඳු බෑවුම්වල පඩිපේළි බඳු පුංචි පුංචි කුඹුරු ලියදි. අපිට නිකම් ගමට ගියා වගේ දැනුනා. රිකිල්ලගස්කඩ හන්දියෙන් හැරිලා දිඹුල්කුඹුරට ගියාම අපිට ඉස්සෙල්ලම හමු වුනෙත් ගැමියෙක්.**

ඉරු රැස් රස්නේත් අඩු හින්ද මම මේ ලික්ස් පැල ටිකක් හිටවන්න ගත්තා. මයේ පුතාල ඔය ටික හිටවන්න කෝ. මම මේ මහත්තුරු එක්ක ටිකක් කථා කරලා එන කන්. ඔබේසේකර බංඩා මහත්තයා ගෙමිදුලට ආවා.

බණ්ඩා මහත්තයා සල්ලි කඳකට නේ අත ගහලා තියෙන්නේ. දැන් කොළඹ ලික්ස් රු. 2.60 යි. ඕවා මහත්තයා එන අවුරුදු කාලෙට ගලවන ඒවා. මේ දවස්වල ඔය එණු නැති හින්දනේ. මගේ ළඟ නම් රතුළුණුත් තියෙනවා. යමුකෝ ගේ ඇතුළට. මෙකේ තවම කපරාරුව ඉවර කර ගන්නත් බැරිවුනා. ඔහු අපිව ගෙතුළට කැඳවමින් කිය.

මගේ කතාව ද කොහොම ද පටන් ගන්නේ ඔහු ජටාව අතට ගත්තා. මයේ පුතා තේ ටිකක් හදන්න අම්මට කියන්න. මම නම් ඉංගිරිසියට බයේ ගොවිතැනට බැස්ස කෙනෙක්. තිස් ගණන්වල මතකය ඔහු අළුත් කලේය. ඔව් මම හතරවෙනි කැලැසියට පාස් වුනා. ටික දවසකින් ඔය ඉංගිරිසි උගන්නන්න පටන් ගත්තා. මට හරිම බයක් ඇති වුනේ. අපේ පරම්පරාව කන් ඕක දෙඩල කියපු කෙනෙක් නැහැනේ. ඉස්කෝලේ යෑමත් එතනින් හමාර වුනා. ඔය තිස් අටේ තරම. වයස දෙළහක් විතර. එද ඉඳලා අප්පොච්චි එක්ක කුඹුරු වැඩට ගියා.

ඒ කාලෙත් මෙහේ මහට කුඹුරු. යලට එළවළු. එතකොට මම ගැටයා නේ. පස්සේ වඳුරාගල මහත්තයා ගේ කුඹුරු බලා ගන්න එක්ක මෙහාට ආවා. නිකමට තියෙන හරියේ එළවළු හිටෙව්වා. 1950 තරම මම මේ ඉඩම බද්දට ගත්තා. වී දෙපැලක් ගොවිතැන් කළා මහට. යලට, බෝංචි, ලීක්ස්, අල, රතුළුණු හිටෙව්වා. ඔහොම ලබාපු ආදයමින් 1961 දී මේක සින්නක්කරේට ගත්තා. මයේ පුතා සොල්දරෙන් එණු ටිකක් ගේන්න. ඔහු තම ගෙවත්තේ වගාවෙන් ලබා ගත් එණු කූඩයක් අපට පෙන්වීය. මේ අනික් වගාවට පැල ගන්න තියපුවා. පසුගිය දවස්වල හොණ්ඩරය රු. 320 ට දුන්නා. මේ බෝල අලත් එහෙමට තියපුවා. බන්ඩා මහත්තයට එහෙනම් හොඳට වාසි ඇති නේ. කුඹුරු යි, එළවළුයි දෙකම.

එහෙමකට වාසියක් කොහේද මහත්තයා. මට දරුවෝ අට දෙනෙක් නේ. වී කවදවත් විකුණන්නේ නැහැ. කන්න තියා ගන්නවා. එළවළු ටිකෙන් අල, රතුළුණු වලින් තමයි, ඉතින් ආදයමක් ගන්නේ. මහත්තයාලා හාල් පොත් ගන්න වැඩේට ආපු අය නොවයි. බණ්ඩා මහත්තයා විස්තර ටිකක් කියන්න කෝ. දිසානායක, විතාන ගේ මහත්වරු සිනා සෙමින් යළිත් අපේ උදව්වට ආවා. මේ දවස්වල ගම්මු බයයි වගා තොරතුරු කියන්න. හාල් පොත් නැති වෙයි කියලා ඒකයි. ආදයමක් නැතුවම නොවෙයි. මයේ පුතාලට වියදම් ගිහින්

ඉතුරුවායින් තමයි මේ ගේ මේ තරමටවත් නග්ග ගත්තේ. ඔහු දරු කැල දිහා මෙන් ම ගේ ඇතුළත ද බලමින් කීය.

බණ්ඩා මහත්තයට ආදයමක් ලැබෙන්නේ එළවළු, එණු වලින් කිව්වා නේ. ඒ වගාවල් ගැන ටිකක් කියන්න කෝ. මෙහේ වතුර තමයි ප්‍රශ්නේ. අනික ඉඩම් හිඟයකුත් තියෙනවා. රිකිල්ලගස්කඩ එළවළු මිලට ගන්න ආණ්ඩුවේ තැනක් තියෙනවා නම් හොඳයි. නැත්නම් අපි හරිම අමාරුවේ තමයි.

අනිත් ප්‍රශ්නේ තමයි, එළවළු වික්කීම. අපිට සාධාරණ මිලක් දීලා එළවළු ගන්න එන්නේ දෙපාර්තමේන්තුවේ ලොරි විතරයි. අනික් අය කුණු කොල්ලෙට තමයි. වැරැද්දකට තියෙන්නේ දෙපාර්තමේන්තු ලොරි නිතර නොඑන එක තමයි.

බණ්ඩා මහත්තයා විකුණන්නේ කොහොම ද?; ඉස්සර මෙහාට එන කාටහරි දුන්නා. පස්සේ කොළඹ මුදලාලිලාට යවනවා. හැබැයි කවදාවත් හමු වෙලා නැහැ. ලොරිය විතරයි දෙපැත්ත මුණ ගැහෙන්නේ. ලොරිය අපෙන් බඩු ගෙනියනවා. මුදලාලිට දෙනවා. ආපසු අපිට සල්ලි දෙනවා. හුඟාක්එළවළු ජාවාරම කරන්නේ ඔය විදිහට. නමින් විතරක් දෙපැත්ත දන්නවා.

දූන් වගාව පටන් ගන්නේ කොහොම ද? බීජ අල, එළවළු ඇට, තෙල් බෙහෙත් එහෙම. බොරු කියන්නේ මොකට ද? මම ඔය ඔක්කෝම පිට කඩෙන් තමයි ගන්නේ. පළදාවර්ධනෙන් ඕවා දෙනවා කිව්වට මගේ කිසි සම්බන්ධයක් තිබුනේ නැහැ ඒකත් එක්ක. ඒකෙන්, සමුපකාරෙන් එහෙම ඕවා ගන්න එක හරි ප්‍රශ්නේ. පිටින් ගන්න එක පහසුයි. ගාණ වැඩි වුනත්.

**තෙල්, බෙහෙත් එහෙම නියම වෙලාවට ගහනවා ද?. ඒවා නම් කරනවා. මේ මහත්තුරු කියන විදිහට. ඒ වුනාට දූන් තෙල් බෙහෙත් වලට හරියට බූමිතෙල් කලවම්**

**හතළිස් වසරක දහඩිය මහන්සියේ පලය හරිහැටි ඔවුනට ලැබී ඇත් ද? බරක් නැතිව සැහැල්ලු සිතකින් එදා ගොවිතැනට බැස්ස ඔහු අද ආරේට මෙන් සිය දරුවන් ගොවිතැනට බසිනු බරවූ සිතකින් මෙනෙහි කරන්නේ ඇයි?**

**කරලා. කොච්චර ගැහුවත් පලක් නැහැ. මේවා ගැන හොයන්න බලන්න කෙනෙක්**



**නැද්ද? කීයක් අරගෙන හරි අපිට හරි බෙහෙතක් දෙන්න එපායැ. තෙල් ගහන මැසිමකුත් ගත්තා. ඒකත් කැඩිලා. අපිත් දුක් මහන්සියෙන් හම්බ කරන සල්ලි නේ. ඉතින් ඒවාට වටින්න මේවාත් දෙනවා නම් කොච්චර එකක් ද? අපෙන් බඩු ගන්න කොට නම් හැම දෙයම කොයි කාටත් හොඳට ඕනි. අපි එහෙම දෙනවා. ඇයි අපට එහෙම සලකන්නේ නැත්තේ.**

කොළඹ මිලත් එක්ක බැලුවම සාධාරණ මිලක් ලැබෙනවා ද කියලා දැන ගන්නේ කොහොම ද? හුඟාක් විට අපිට සාධාරණයක් නැහැ. මම රේඩියෝ එකේ කියන මිල ගණන් අහගන්නවා. ලොකු දුව තමයි ඒවා ලියා ගන්නේ. නැත්නම් නුවරට ගිහින්

වෙළඳ පලේ ගණන් බලන් එනවා. ඒ අනුව තමයි විකුණන්නේ. ආණ්ඩුවේ තැනක් රිකිල්ලගස්කඩ දමනව නම් අපිට ඔය කර දර එකක්වත් නැහැ.

එළවළු මිළ නගින්නේ ලොරි කුලිය හින් දලු නේද? මොනවා ද මහත්තයා ලොරියක එළවළු ගෝනි කීයක් ගහනවා ද? ගෝනිය කට රුපියල් හත අටකට වැඩි වෙන්නේ නැහැ. එක එක ගානේ බැලුවොත්. එක ගෝනියක රාත්තල් කීයක් ද? ඉතින් ඔහේලා ඒ පළාත්වල දී ගෙවන ගාණයි, අපිට ගෙවන ගානයි සාධාරණ ද? සල්ලි දෙන්නේ කවුද? සල්ලි ගන්නේ කවුද? වවන අපිද නැහැ නේ.

කඳපොල පැත්තේ වගේ මෙහෙත් එළවළු ජාති කිපයක් එකම පාත්තියේ දමනවා ද? මෙහේ එහෙම නැහැ. ඒ පැත්තේ ඉඩම් හිහයි නේ. අපිට දැනට එහෙම ප්‍රශ්නයක් නැහැ. වෙන වෙනම හිටවන්න ඉඩ තියෙනවා. ඉස්සරහට නම් ප්‍රශ්නයක් වෙයි.

ඉංගිරිසියට බයේ හරි ගොවිතැනට බැස්ස එක ගැන දූන් බණ්ඩා මහත්තයට මොකද හිතෙන්නේ. අපොයි මහත්තයා මට ලොකු සැනසීමක්. තමන් ගේ දෙයක් කරගෙන නිදහසේ ඉන්න තියෙන එක කොයි තරම් දෙයක් ද? මෙහෙම නිදහසක් ආණ්ඩුවේ හරි වෙන කවුරු ළඟ හරි රස්සාවක් කලානම් නැහැනේ. ඒ අතින් මට සතුටුයි. හැබැයි ළමයි ගැන ටිකක් දුක යි.

ඒ ඇයි? මගේ ලොකු පුතාත් දූන් ඉස්කෝලේ යන්න බෑ කියලා මගේ පස්සෙන් වැටිලා ගොවිතැනට. එයාලගේ කාලේ වෙන කොට මේවායින් ම ජීවත් වෙන්න බැරි බව අපට තේරෙනවා. මයේ පුතාලාත් රස්සාවක් කරනවා නම් හොඳයි. ඉඩම් වැඩිය නැහැනේ. හැමෝටම මේකේම හැපෙන්න පුළුවන් යැ. ගෙයි ඉතුරු වැඩ ටික කර කර ගන්නත් ඕනැ. මගේ පුතාලාට උගන්නන්නත් ඕන. තව අපේ පවුල්වලට අම්මා තාත්තලාට කරන්න ඕන යුතුකම් තියෙනවා. ඔහොම තමයි අපේ ජීවිතතේ. පණස් හැවිරිදි ඔබේසේකර බණ්ඩා මහතා ගෙන් අපි සමු ගත්තා.

හතළිස් වසරක දහඩිය මහන්සියේ පලය හරිහැටි ඔවුනට ලැබී ඇත් ද? බරක් නැතිව සැහැල්ලු සිතකින් එද ගොවිතැනට බැස්ස ඔහු අද ආරේට මෙන් සිය දරුවන් ගොවිතැනට බසිනු බරවූ සිතකින් මෙනෙහි කරන්නේ ඇයි?